8 වන පිටුවෙන්

## අම්මා.....

ඇති මහිමය මවගේ ආශීර්වාදය කේන්ද්‍රකොටගත් දෙයක් බැව් වැටහෙන්නේ මවකට සලකන දූදරුවන් ලබන භාග්‍යවන්ත ජීවිත දෙස බැලූවිටය. ඔබ තවම පමා වී නැත. ඔබේ ආදරණීය වචනයක් තම දෙමාපියන් වෙනුවෙන් වියදම් කිරීමට ලෝභී නොවන්න.

තමන් උපයන දෙයින් බිඳකින් ඔවුන්ට සැලකීමට කාරුණිකවන්න. සදාකල් මවගේ උණුසුමට තුරුළුවන්න. ඔබේ මව ඇගේ රුධිරය ඔබට කිරිකර පොවන අතරතුර ඇගේ උණුසුමින්, ආදරයෙන් හා ඉහළම භක්තිමත් හැඟීමෙන් ඔබව පෝෂණය කළ බව සිතන්න. මවගේ නැළවිලි ගීතය තරම් රසවත් හඬක් දරුවෙකු මේ මිහිපිටින් අසා නැත. අපගේ මේ මුළු ජීවිතයම මවගේය. අප ඉපදෙන විටම අප ඇයට ණයගැතිය. ඒ ණය ගෙවීමට තරම් වටිනාකමක් මේ මිහිපිට කොහෙන්වත් සොයාගත නොහැකිය.

හොඳම දේ දරුවන්ට දුන්නේ මවය. මවටද හොඳම දේ දිය යුත්තේ ඒ නිසාවෙනි. සමහරු තම මවට තමා පාවිච්චිකර ඉවත ලන ඇඳුම් ආදී දේ දෙති. නොකීවාට නොපෙන්නුවාට මවකගේ හිත එවිට කියන දේ ඔබට කිසි දින නොවැටහී තිබුණද ඒ පුතේ මම උඹට දුන්නේ පවිත්‍ර නොකිළිටි හොඳම දේ යයි යන්න මොහොතකදී අපට සිහිපත් වනු ඇත.

**ළමා කුසලතා සංවර්ධන වැඩසටහනේ අධ්‍යක්ෂිකා**
**රත්නා පුෂ්ප කුමාරි**
Sri Lanka

# ලන්ඩනයේ මාලිනී උපහාර

**2010 දෙසැම්බර් 31 දින බටහිර ලන්ඩනයේ RNB ශාලාවේ පැවතියේය.**

*Photographs* -Chinthaka Weerasinghe
ජායාරූප - චින්තක වීරසිංහ



ශාලාව අබියසදී ලිලානි පෙරේරා මහත්මිය විසින් ආචාර්ය මාලිනී ෆොන්සේකා මන්ත්‍රීතුමිය පිළිගන්නා ලදී



ලන්ඩනයේ ශ්‍රීලංකා මහකොමසාරිස්තුමා, මාලිනී ෆොන්සේකා මහත්මිය, ජැක්සන් ඇන්තනි මහතා සහ සංගීතඥ කීර්ති පැස්කුවල් මහතා





ශ්‍රීලංකා මහකොමසාරිස් විනිසුරු නිහාල් ජයසිංහ මහතා, මාලිනියට උපහාර සම්මානය පිරිනමයි



මාලිනීගේ ලේලියක් වන සෙනාලි ෆොන්සේකා එදා විශේෂ නැටුමක් ඉදිරිපත් කරමින්



මාලිනී තම නැගණිය ශ්‍රියානි සහ ඇයගේ දියණියන් දෙදෙනාද එකතු කරගෙන සිය දෙමාපියන්ට උපහාර පිණිස අතීතයේ පබැඳූ ගීයක් මෙහිදී ගායනා කළාය.

ජාත්‍යන්තර සම්මානයට පත් ශ්‍රීලංකාවේ අසහාය සිනමා කලාකාරිය වශයෙන් අද දවසේ නිසැකවම හැඳින්විය හැකි ආචාර්ය මාලිනී ෆොන්සේකා මහත්මියට උපහාර දැක්වීමේ උළෙලක් සති දෙකකට ඉහත එනම් 2010 දෙසැම්බර් 31 වෙනි දින ලන්ඩනයේදී පැවැත්විණ. එදින මාලිනී රඟපාමින් සම්මාන දිනූ **ආකාස කුසුම්** චිත්‍රපටය ද තිරගත වීය. කලාකාමී පිරිසක් සහභාගිවූ එහි ප්‍රධාන ආරාධිත අමුත්තා වූයේ ලන්ඩනයේ ශ්‍රීලංකා මහකොමසාරිස්වර විනිසුරු නිහාල් ජයසිංහ මහතාය. කලාකරු ජැක්සන් ඇන්තනි සහ සංගීතඥ කීර්ති පැස්කුවල් යන මහත්වරුද ශ්‍රීලංකාවේ සිට විශේෂ යෙන් පැමිණි අය වූහ. භික්ෂූන් වහන්සේලා පිරිත් සජ්ජායනා කළ සේක.

ලෝක සිනමාවේ විශේෂිත නළුනිළියෝ සිටිති. ඔවුන් කල්ප ගණනක් ගියද කාලසීමාවක් නොතකා අගැයීමට ලක්වේ. නිළියන් ගත් කළ ග්‍රේටා ගාබෝ, බෙටී ඩේවිස්, එලිසබෙත් ටේලර්, සොෆියා ලොරේන්, ජේන් ෆොන්ඩා ආදීන් දැන් සිනමා තිරයේ දක්නට නැතත් තවමත් ලෝ පුරා රසික හදවත්හි ජීවත්වෙති. එයට හේතුව ඔවුන් රඟපෑම් විශයෙහි ලා දැක්වූ අනභිබවනීයත්වයයි. ඒ රඟපෑම් ඔවුනටම ආවේනික වූවක් වෙති. එය කොපිකරන්නට බැරිය. එහෙත් එය අනුගමනය කරන්නට ගුරුකොට සලකන්නට කදිමය. මතු පරම්පරාවලට ඔවුන් දෙස බලා ඉගෙන ගන්නට බොහෝ දේ ඇත. දැනුදු ඒ පැරණි නළු නිළියන්ගේ පැරණි චිත්‍රපට දකින්නට අප කාටත් ආශාවක් ඇත්තේ තාක්ෂණය අද මෙන් දියුණුව නැති යුගයේ ඔවුන් සිය රංගන කුසලතාවෙන් මුහුණේ ඉරියව්වලින් දෙබස් උච්චාරණයෙන් ආදියෙන් පෑ ප්‍රාතිහාර්යයන් නිසයි.

මාලිනී ෆොන්සේකා නම් ඒ විශිෂ්ඨ කලාකාරිය ගැනද කිව හැක්කේ එයමය. සිනමාව තුළ ඇය ආ දිගු ගමනේ දී කොතැනක හෝ අඩුවක් අපි නොදුටුවෙමු. සිනමා ක්ෂෙත්‍රයට පිවිසෙන්නට සිතන ලාංකික තරුණ පෙළට මාලිනී ෆොන්සේකා නම් නිළිය මැවූ විවිධ චරිතයන් දෙස බැලීමෙන්ම බොහෝ දේ ඉගෙනගත හැකිය. මා ඉහතින් දැක්වූ ලෝක සිනමාවේ විශිෂ්ඨ සිනමා කාන්තාවන් අතරට නිතැතින්ම ඇය එක්වෙයි. මේ සියල්ල උපතින් ලත් වාසනාව මෙන්ම රඟපෑම හරි හැටි හඳුනාගැන්මය. මාලිනීලා කොතෙක් සිටිය ද මාලිනී ෆොන්සේකා මෙපමණය.

♦ **දයා**

# ලාබාලම කරාටේ ශූරීය 6 හැවිරිදි කෙවෙල්

උතුරු ලන්ඩනයේ ටොටින්හැම් පෙදෙසේ වෙසෙනහය හැවිරිදි කෙවෙල් ඩි සොසා ඩෝල්ටන් යුරෝපයේ ලා බාලම කරාටේ ශූරිය ලෙස සැලකේ. එසේම කලු පටියක් ලත් ලාබාලම දැරියත් ඇයය.

මේ දැරියගේ සොහොයුරා ද කරාටේ ශූරයෙකි. කෙවෙල් අතදරුවෙකු කළ සොහොයුරා ගෙදර කරාටේ පුහුණු වනු බලා ඇයට ඒ පිළිබඳ ආසාවක් ඇතිවෙන්නට ඇතැයි කෙවෙල්ගේ මව පවසයි.

පාසැලේ දී පන්තියේ ළමයින්ගෙන් ඇයට කිසිදු කරදරයක් ඇති නොවේ. ඇයගේ දක්ෂතාව දන්නා පිරිමි ළමයින්ද අරියාදු කරන්නට එන්නේ නැත. එක් වරක් පමණක් ඇය දැක්වූ ප්‍රතික්‍රියාවකින් ලොකු පිරිමි ළමයෙක් තුවාල ලැබීය. කෙවෙල් නිතරම ඉන්නේ තමන්ගේ පාඩුවේය.

